# දැන්වීමයි

## භාවිතයෙන් ඉවත් කරන ලද වාහන අමතර කොටස් සහ ටයර් විකිණීම.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කරන ලද පහත ද්‍රව්‍ය විකිණීම පිණිස මිල ගණන් කැඳවනු ලැබේ.

1. භාවිතයෙන් ඉවත් කරන ලද ලොරි,කාර් සහ කැබ් රථ ටයර්.
2. භාවිතයෙන් ඉවත් කරන ලද ෆෝර්ක් යන්ත්‍ර ටයර්.
3. වාහන අමතර කොටස්.
4. මෝටර් වාහන විදුලි පද්ධති උපාංග

ඉහත ද්‍රව්‍ය අතුරින් අංක 01, 02 යන අයිතම සඳහා එක් ටයරයකට සහ සම්පූර්ණ ටයර් තොගයටම වන පරිදි මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, වාහන අමතර කොටස් සඳහා කිලෝ එකකට වන පරිදි සහ විදුලි පද්ධති සම්බන්ධ කොටස් සඳහා සම්පූර්ණ තොගය සඳහාම වන පරිදි මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

<u>අයදුම්පත් ලබා ගැනීම.</u>

ආපසු නොගෙවන රු:250/- ක මුදලක් ගෙවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රවාහන අංශය වෙතින් මේ සඳහා වන අයදුම්පත් 2019/05/23 දින පෙ.ව. 09.00 සිට 2019/05/28 දින පෙ.ව. 10.00 තෙක් ලබා ගත හැකි අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එක් එක් කාර්යය සඳහා ලංසු ඇපකරය ලෙස පහත පරිදි මුදල් දෙපාර්තමේන්තුවේ සරප් වෙත තැන්පත් කර, එම කුවිතාන්සියේ මුල් පිටපත මිල ගණන සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

| කාර්යය | ලංසු බැඳුම්කරයේ වටිනාකම |
|---|---|
| 1. භාවිතයෙන් ඉවත් කරන ලද ලොරි,කාර් සහ කැබ් රථ ටයර්. | රු: 5,000.00 |
| 2. භාවිතයෙන් ඉවත් කරන ලද ෆෝර්ක් යන්ත්‍ර ටයර් | රු: 1,000.00 |
| 3. වාහන අමතර කොටස්. | රු: 5,000.00 |
| 4. මෝටර් වාහන විදුලි පද්ධති උපාංග | රු: 5,000.00 |

<u>ලංසු ඉදිරිපත් කිරීම.</u>

2019/05/28 දින ප.ව.2.00 ට පෙර මිල ගණන් ප්‍රවාහන අංශයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහා ලිය යුතුය. ලංසු බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කාර්යය පැහැදිලිව සඳහන් කළ යුතුය.

<u>මිල ගණන් විවෘත කිරීම.</u>

**2019/05/28** දින ප.ව.**2.00**ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම මිල ගණන් විවෘත කිරීම සිදු කෙරේ.

ඉදිරිපත් කර ඇති මිල ගණන් අනුව තෝරා ගැනීම සිදු කළ පසු සාර්ථක ලංසුකරු වෙත ලිඛිතව ඒ බව දැනුම් දෙනු ලැබේ. ඒ අනුව අදාළ කාර්යය සඳහා ලංසු ප්‍රදානය කළ වහාම දින **02**ක් ඇතුළත අදාළ ද්‍රව්‍ය සම්පූර්ණයෙන් ඉවත් කර ගත යුතු අතර, පිළිගනු ලබන මිල ගණන් අනුව අදාල ද්‍රව්‍ය සඳහා වන සම්පූර්ණ මුදලම නියමිත තොගය ඉවත් කර ගැනීමට පෙරාතුව දෙපාර්තමේන්තුවේ සරප් වෙත තැන්පත් කළ යුතුය. අංක 03 අයිතමය සඳහා පමණක් ප්‍රමාණය කිරා මැන බැලීමෙන් අනතුරුව ගෙවිය යුතු මුදල ගෙවීමට කටයුතු කළ යුතු අතර, අවස්ථානුකූලව නියම කරනු ලබන අත්තිකාරම් මුදලක් එම තොගය ඉවත් කර ගැනීමට පෙර දෙපාර්තමේන්තුවේ සරප් වෙත තැන්පත් කළ යුතුය.

ගංගානි ලියනගේ.
රජයේ මුද්‍රණාලයාධිපති.
**2019/05/23**